# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2499/09 - 2026 ජූලි මස 27 වැනි සඳුදා - 2026.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

අනුර කුමාර දිසානායක

ජනාධිපති විධානය

1. ගරු විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍ය
2. ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍ය
3. ජනාධිපති ලේකම්
4. ලේකම්, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
6. ලේකම්, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
7. ලේකම්, පරිසර අමාත්‍යාංශය
8. ලේකම්, කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
9. ලේකම්, ප්‍රවාහන, මහා මාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
10. අතිරේක ලේකම් (සංවර්ධන), සංචාරක අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය
11. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
12. සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
13. සභාපති, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය
14. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල
15. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව


1A - G 47396 — 354 (2026/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

16. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
17. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී දෙපාර්තමේන්තුව
18. අධ්‍යක්ෂ ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
19. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
20. ආගමන විගමන පාලක ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
21. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය
22. පොලිස්පති, පොලිස් දෙපාර්තමේන්තුව
23. දුමින්ද හුලංගමුව මැතිතුමා
24. ක්‍රිෂාන් බාලේන්ද්‍ර මැතිතුමා
25. නිහාල් මුහන්දිරම් මැතිතුමා
26. නලින් ජයසුන්දර මැතිතුමා
27. සුරන්ජිත් වැව්ට මැතිතුමා
28. ශිරෝමාල් කුරේ මැතිතුමිය

වෙත,

ශුභාශිංසන පූර්වකවය!

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, වර්ෂ 2025 ක් වූ අගෝස්තු මස 19 වැනි දිනැති ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කටයුතු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, ප්‍රවාහන, මහා මාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් උක්ත කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබ ඇති නමුත් මේ වනවිට එම අමාත්‍යාංශයේ විෂය පථය ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වශයෙන් අමාත්‍යාංශය දෙකක් යටතේ ගැසට් කර ඇති බැවින්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් උක්ත කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකු ලෙස පත්කළ යුතු බවට මා විසින් අදහස් කරන හෙයින් ද,

තවද, සංචාරක කර්මාන්තයෙහි ප්‍රගමනය උදෙසා සාධනීය කාර්යභාරයක් ඉටු කරනු ලබන ශ්‍රී ලංකා හෝටල් සංගමයේ නියෝජනය ද මෙම කාර්ය සාධක බලකාය වෙත ලබා ගතයුතු බවට මා විසින් අදහස් කරන බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත නම් සඳහන් නිලධාරින්, එතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ පක්ෂපාතීත්වය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කටයුතු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් ලෙස මෙයින් පත් කරමි.

01. ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය
02. ලේකම්, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
03. සභාපති, ශ්‍රී ලංකා හෝටල් සංගමය

වර්ෂ දෙදහස් විසිහයක් වූ ජූලි මස 24 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ආචාර්ය **එන්. එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

EOG 07 - 0389

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.